# ශ්‍රී ලාංකේය ජන ගායනයන්හි ප්‍රකට වන සිංහල ගායන ශෛලි

පනාපිටි කංකානමලාගේ සමන් ප්‍රේමසිරි රත්න කුමාර

දර්ශනසූරී 2018

# ශ්‍රී ලාංකේය ජන ගායනයන්හි ප්‍රකට වන

# සිංහල ගායන ශෛලි

පනාපිටි කංකානමලාගේ සමන් ප්‍රේමසිරි රත්න කුමාර

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ

දර්ශනසූරී උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ

නිබන්ධය

## අපේක්ෂකයාගේ ප්‍රකාශය

මෙම දර්ශනසූරී උපාධි පර්යේෂණ නිබන්ධය, ආචාර්ය ඩබ්ලිව් බී. ඒ. විතාරණ මහතා ගේ සහ මහාචාර්ය රංජිත් ප්‍රනාන්දු මහතා ගේ උපදෙස් මත පුස්තකාල ග්‍රන්ථ අධ්‍යයනයෙන්, මෙම විෂයට අදාළ විවිධ සම්පත්දායකයින් ගෙන් හා ක්ෂේත්‍රයේ විද්වතුන් සමග සාකච්ඡා කිරීම මගින්, පටිගත කරන ලද සංගත තැටි ශ්‍රවණය කිරිම මගින් දත්ත රැස් කිරීමෙන් මා විසින් ස්වෝත්සාහයෙන් ම කරනු ලැබූවකි. මෙය වෙනත් කිසිදු විශ්වවිද්‍යාලයකට හෝ අධ්‍යාපන ආයතනයකට හෝ ඉදිරිපත් කළ නිබන්ධයක් නො වන බවත් මෙහි අඩංගු සියලු කරුණු මූලාශ්‍රය සඳහන් කිරීමකින් තොර ව ඇතුළත් කොට නැති බවත්, මාගේ දැනුම හා විශ්වාසය අනුව වෙනත් කිසිදු කෙනෙකු විසින් මීට පෙර ලියන ලද හෝ මුද්‍රණය කරන ලද හෝ කිසිම කරුණක් මෙම පර්යේෂණ නිබන්ධයෙහි නියමිත සඳහනකින් තොරව ඇතුළත් කොට නැති බවත් මෙයින් සහතික කරමි.

......................................                ......................................

පී. කේ. එස්. පී. රත්න කුමාර.                දිනය

## උපදේශකවරුන්ගේ නිර්දේශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ ලියාපදිංචි අංක 1002HU2016001 යටතේ දර්ශනසූරී උපාධිය හදාරන පී. කේ. එස්. පී. රත්න කුමාර විසින් "ශ්‍රී ලාංකේය ජන ගායනයන්හි ප්‍රකට වන සිංහල ගායන ශෛලි " යන මැයෙන් ලියා ඇති මෙම නිබන්ධය අපගේ උපදේශකත්වය යටතේ දර්ශනසූරී උපාධිය සඳහා උචිත ලෙස සම්පාදනය කොට ඇති බවත්, එකී උපාධි අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශය කරමු.

01. උපදේශක ඃ

..................................................

ආචාර්ය, ඩබ්ලිව් බී. ඒ. විතාරණ.

02. උපදේශක ඃ

...................................................

මහාචාර්ය, රංජිත් ප්‍රනාන්දු.

## පිදුම

සිංහල ජනකවි සොයා ගමින් ගමට ගොස් හෙළ කවි ගායනාවන් හි
වටිනාකම ලොවට පෙන්වා දෙමින් නූතන පරම්පරාවට සිංහල
සංගීතයක උරුමය ඉතිරි කරදුන්, මානවවංශ සංගීත විද්‍යාව ශ්‍රී ලංකාවට
හඳුන්වා දෙමින් හෙළ කවියේ උරුමය අරුමයක් නොකොට
විද්‍යාත්මකව පැහැදිළි කළ ජ්‍යෙෂ්ඨ සංගීත පර්යේෂක

**සී. ද. එස්. කුලතිලක**

ආදරණීය ගුරු පියාණන්ට සෙනෙහසින්........

# පටුන


| | |
|---|---|
| පටුන | i |
| වගු, ප්‍රස්තාර සහ මෘදුකාංග පරිස්‍රාවරණ රූප පටුන | viii |
| උපකාරානුස්මෘති | xiii |
| සාර සංක්ෂේපය | xv |

**පළමුවන පරිච්ඡේදය**

**හැඳින්වීම**

| | | |
|---|---|---|
| 1. | මාතෘකාව හැඳින්වීම | 1 |
| 1.1. | අධ්‍යයන ගැටලුව | 6 |
| 1.1.1. | උපන්‍යාසය | 6 |
| 1.2. | අධ්‍යයනයේ අරමුණු | 6 |
| 1.2.1. | ප්‍රධාන අරමුණ | 6 |
| 1.2.2. | අවශේෂ අරමුණු | 7 |
| 1.4. | අධ්‍යයනයේ වැදගත්කම | 7 |
| 1.5. | පරිච්ඡේද පෙළ ගැස්ම | 8 |

**දෙවන පරිච්ඡේදය**

**සාහිත්‍යයික විමර්ශනය**

| | | |
|---|---|---|
| 2.1 | පූර්ව අධ්‍යයනය | 11 |
| 2.1.1 | කාර්යය භාෂාව හා අර්ථය අනුව ජන ගායන වර්ගකර ඇති ග්‍රන්ථ | 11 |
| 2.1.2. | භාවිත ක්ෂේත්‍ර හා අවස්ථා අනුව ජන ගායන වර්ගකර ඇති ග්‍රන්ථ | 17 |
| 2.1.3. | ගායන ස්වර, තිත හා යති අනුව ජන ගායන වර්ගකර ඇති ග්‍රන්ථ | 30 |
| 2.1.4. | ගායනශෛලි අනුව ජන ගායන වර්ග කර ඇති ග්‍රන්ථ | 34 |
| 2.2. | පරිවර්තන, සංස්කරණ ග්‍රන්ථ හා ලිපි | 36 |
| 2.3. | ජන ගායන ශෛලි පිළිබඳ පශ්චාද් උපාධි පර්යේෂණ ග්‍රන්ථ (විදේශීය) | 40 |

2.4. ඉංග්‍රීසි ග්‍රන්ථ 43

**තෙවන පරිච්ඡේදය**

**පර්යේෂණ ක්‍රමවේදය**

3. පර්යේෂණ ප්‍රවේශය 50

3.1. පර්යේෂණ ක්‍රමය 51

3.1.1. මානවවංශ විවරණ පර්යේෂණ ක්‍රමය භාවිත කිරීමට අදාළ තාර්කිකය 52

3.2. පර්යේෂණ අරමුණු 54

3.2.1. ප්‍රධාන අරමුණ 54

3.2.2. අවශේෂ අරමුණු 54

3.3. අධ්‍යයන ජනගහනය 55

3.4. නියැදි ක්‍රමය 57

3.4.1. නියැදි රාමුව 57

3.4.2. නියැදි ඒකකය 58

3.4.3. නිරීක්ෂණ ඒකකය 58

3.5. දත්ත එක්රැස් කිරීම 58

3.5.1. ලේඛන හඳුනීම් 59

3.5.1.i. ලිඛිත ප්‍රාථමික මූලාශ්‍රය 59

3.5.1.ii. ලිඛිත ද්විතියික මූලාශ්‍රය 59

3.5.1.iii. ලිඛිත නොවන මූලාශ්‍රය (Audio Recording) 60

3.6. භාවිත සංකල්ප ක්‍රමවේද 65

3.6.1. පරස්පර විරෝධීත්ව සංකල්පය 66

3.6.2. මානවවිද්‍යා සංකල්පය 66

3.6.3. ප්‍රත්‍යක්ෂ අධ්‍යයන සංකල්පය 66

3.6.4. පදනම් වූ සිද්ධාන්ත සංකල්පය 66

3.6.5. විශ්ලේෂණාත්මක සංකල්පය 67

3.7. ක්ෂේත්‍ර අධ්‍යයනය 67

3.7.1. නිරීක්ෂණ 67

3.7.2. සහභාගීත්ව නිරීක්ෂණ 67

3.7.3. ජීවන අත්දැකීම් ක්‍රමය 67

3.7.4. සම්මුඛ සාකච්ඡා 68

3.8. දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය 68

3.8.1. ආභාසයීය විශ්ලේෂණය. 68

3.8.2. සාකල්‍යය විශ්ලේෂණය 68

3.8.3. සංවේදී සංදර්භයන් සහිත විශ්ලේෂණය 68

3.8.4. පර්යායලෝක විශ්ලේෂණය 68

3.9. ශත මිණුම් ක්‍රමය 69

3.10. පර්යේෂණ සීමා 69

3.11. ආචාර ධර්ම 70

**සිවුවන පරිච්ඡේදය**

**පර්යේෂණ ප්‍රතිඵල හා සාකච්ඡාව**

4.1. සිංහල ජන කවි වර්ග කිරීම 71

4.1.1. භාවිත ක්ෂේත්‍රය, භාෂාව හා කාර්යය අනුව 71

4.1.2. හින්දුස්ථානී ස්වර අනුව කරන ලද වර්ගීකරණය 72

4.1.3. මාත්‍රා, ජාති හා විරිත් නියමය අනුව ජන කවි වර්ග කිරීම 77

4.2. සිංහල ජන ගායන ශෛලි 92

4.2.1. ගද්‍ය හා සැහැලි ගායන ශෛලිය 92

4.2.1.i. ආගමික හා යාදිනි 96

4.2.1.i.i. ශුද්ධ ස්වර පමණක් යෙදෙන ගායන 100

4.2.1.i.ii. කෝමල ගාන්ධාරය පමණක් යෙදෙන ගායන 109

4.2.1. i.iii. කෝමල ගාන්ධාරය හා නිෂාදය පමණක් යෙදෙන ගායන 111

4.2.1. i.iv. කෝමල ගාන්ධාරය, නිෂාදය හා රිෂභය යෙදෙන ගායන 112

4.2.1.ii. ගද්‍ය ගායන ශෛලියේ අනන්‍යතා ලක්ෂණ 124

4.2.2. වන්නම්, ප්‍රශස්ති, හටන් කවි හා සින්දු ගායන ශෛලිය. 125

4.2.2.i. වන්නම් ගායන ශෛලිය 125

4.2.2.i.i. උඩරට වන්නම් ගායන 130

4.2.2.i.ii. සබරගමු වන්නම් ගායන 163

4.2.2.i.iii. සින්දු වන්නම් ගායන 168

4.2.2.ii. ප්‍රශස්ති හා හටන්කවි ගායන 176

4.2.2.ii.i. ප්‍රශස්ති 176

4.2.2. ii.ii. හටන් 189

4.2.2. iii. සින්දු ගායන 195

4.2.2. iv. වන්නම්, ප්‍රශස්ති, හටන් කවි, හා සින්දු ගායන ශෛලියේ අනන්‍යතා ලක්ෂණ 207

4.2.3. සීපද හා සිවුපද ගායන ශෛලිය 207

4.2.3. i. සීපද ගායන 208

4.2.3.i.i. පැල් සීපද 209

4.2.3.i.ii. ගැල් සීපද 221

4.2.3.i.iii. පතල් සීපද 231

4.2.3.i.iv. පාරු සීපද 241

4.2.3.i.v. බඹර සීපද 249

4.2.3.i.vi. විවිධ අර්ථ හා බැඳි සීපද 253

4.2.3.i.vi.i. අවමඟුල් සීපද 253

4.2.3. i.vi.ii. නෙලුම් සීපද 254

4.2.3. i.vi.iii. ගමන් සීපද 255

4.2.3. i.vi.iv. උපදේශ සීපද 256

4.2.3. i.vi.v. දේශාභිමානී සීපද 257

4.2.3. i.vi.vi. දහම්ගැට සීපද 258

4.2.3.i. සීපද ගායනයේ අනන්‍යතා ලක්ෂණ 258

4.2.3.ii. සිවුපද ගායන 275

4.2.3.ii.i. ටීකා සිවුපද 280

4.2.4. නෙළුම් ගායන ශෛලිය 284

4.2.4.i. නමස්කාර කවි ගායන 290

4.2.4.ii. දිග්ඕස ගායන 291

4.2.4.iii. කෙටිඕස ගායන 293

4.2.4.iv. කොටකවි ගායන 296

4.2.4.v. තලමල කවි ගායන 298

4.2.4.vi. තෙතඟු කවි ගායන 302

4.2.4.vii. කුරහන් කවි ගායන 304

4.2.4.viii. නෙළුම් ගායන ශෛලියේ අනන්‍යතා ලක්ෂණ 307

4.2.5. නැළවිලි ගී ගායන ශෛලිය 309

4.2.5.i. නාදස්ථාන හා ස්වර භාවිතය 312

4.2.5.ii. නාදරූප හා අලංකාර භාවිතය 318

4.2.5.iii. භාෂා භාවිතය 319

4.2.5.iv. රිද්මරටා භාවිතය 322

4.2.5.v. විවිධ ප්‍රබන්ධ ක්‍රම හා ගායන විධි භාවිතය 323

4.2.5.vi. නැළවිලි ගී ගායන ශෛලියේ අනන්‍යතා ලක්ෂණ 324

4.2.6. වැලපුම් ගී ගායන ශෛලිය 326

4.2.6.i. මූලික අවශ්‍යතා මත බිහිවූ වැලපුම් ගායන 329

4.2.6.ii. ශාන්තිකර්මයන්හි භාවිත වැලපුම් ගායන 336

4.2.6.iii. ගැමි නාටකවල භාවිත වැලපුම් ගායන 340

4.2.6.iv. වැලපුම් ගී ගායන ශෛලියේ අනන්‍යතා ලක්ෂණ 343

4.2.7. අඬහැර ගායන ශෛලිය 344

4.2.7.i. දීර්ඝ යති භාවිතය 347

4.2.7.ii. ඉහළ නාද පරාස භාවිතය 353

4.2.7.iii. කටහඬේ විවිධ ශබ්ද, වර්ණ හා හැඩතල නිර්මාණය කිරීම 355

4.2.7.iv. ස්වර අතර පරතරය 356

4.2.8. කෙළි ගී ගායන ශෛලිය 358

4.2.8.i. ළමා කෙළි ගී ගායන 359

4.2.8.ii. යොවුන් කෙළි ගී ගායන 361

4.2.8.iii. ඇදහිලි සම්බන්ධ කෙළි ගී ගායන 366

4.2.8. iii.i. ඔංචිලි කවි 366

4.2.8. iii.ii. අංකෙළි කවි 370

4.2.8. iii.iii. ඔළිඳ කවි 373

4.2.8. iii.iv. රබන් කවි 375

4.2.8.iv. කෙළි ගී ගායන ශෛලියේ අනන්‍යතා ලක්ෂණ 390

4.2.9. බැති ගී ගායන ශෛලිය 390

4.2.9.i. තුන්සරණේ කවි 392

4.2.9.ii. කිතුණු බැති ගී 396

4.2.10. කවිතාල හා සාහිත්‍ය ග්‍රන්ථවල අතුළත් කවි ගායන ශෛලිය 398

4.2.11. ජන නාට්‍ය, ජන නැටුම් හා සවුදම් ගායන ශෛලිය 408

4.2.11.i. සොකරි 408

4.2.11.ii. කෝලම් 409

4.2.11.iii. ජන නැටුම් හා බැඳි ගායන 413

4.2.11.iii.i. ගොයම් නැටුම 415

4.2.11.iii.i.i. කමත් 418

4.2.11.iii.ii. කළගෙඩි නැටුම 421

4.2.11.iii.iii. තාලම් නැටුම 423

4.2.11.iv. සවුදම් 426

4.2.12. ශාන්තිකර්ම ගායන ශෛලිය 432

4.2.12.i. උඩරට සම්ප්‍රදාය 432

4.2.12.ii. පහතරට සම්ප්‍රදාය 432

4.2.12.iii. සබරගමු සම්ප්‍රදාය 433

4.2.12.iv. ශාන්තිකර්ම ගායන ශෛලියේ ලක්ෂණ 441

4.2.13. සිංහල ජන ගායන ශෛලියේ භාවිත නාද ස්ථාන පිළිබඳ විමර්ශනය 442

**පස්වන පරිච්ඡේදය**

**සමාලෝචනය හා යෝජනා**

5. සමාලෝචනය 454

5.1. යෝජනා 461

මූලාශ්‍රය, ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය 463

## වගු, ප්‍රස්තාර සහ මෘදුකාංග පරිස්‍රාවරණ රූප පටුන

මෙම පර්යේෂණ ග්‍රන්ථයේ දක්වා ඇති වගු සටහන්, ස්වර හා නාද ප්‍රස්තාර සහ විවිධ පරිගණක මෘදුකාංග මගින් ලබා ගන්නා ලද ගායන හඬ, නාද හා යති විමර්ශණය කරනු ලබන පරිස්‍රාවරණ රූප සහ ශත මිණුම් ක්‍රමයට සොයාගත් සංඛ්‍යාත දත්ත අතුළත් පිටු පිළිබඳ සටහනක් පහත දක්වමි.

**වගු, රේඛා ප්‍රස්තාර, ස්වර ප්‍රස්තාර හා මෘදුකාංග පරිස්‍රාවරණ රූප**


| | | |
|---|---|---|
| i. | අධ්‍යයන ජනගහන නියැදිය ඇතුළත් වගුව | 55 |
| ii. | පටිගත කරන ලද කවි ගායන ඇතුළත් මූලාශ්‍රය වගුව | 61 |
| iii. | ගීත ස්වර ප්‍රස්තාරය - (සවන පිනන) | 73 |
| iv. | ගීත ස්වර ප්‍රස්තාරය - (සම්මා සම්බුදු) | 74 |
| v. | ගීත ස්වර ප්‍රස්තාරය - (කෝමල රි ග යෙදෙන) | 75 |
| vi. | ගීත ස්වර ප්‍රස්තාරය - (කෝමල ග නි යෙදෙන) | 75 |
| vii. | ගීත ස්වර ප්‍රස්තාරය - (කෝමල ග යෙදෙන) | 76 |
| viii. | ගීත ස්වර ප්‍රස්තාරය - (තිශ්‍ර ජාති) | 78 |
| ix. | ගීත ස්වර ප්‍රස්තාරය - (චතුරශ්‍ර ජාති) | 78 |
| x. | ගීත ස්වර ප්‍රස්තාරය - (මිශ්‍ර ජාති) | 78 |
| xi. | ගීත ස්වර ප්‍රස්තාරය - (උපමිශ්‍ර ජාති) | 79 |
| xii. | ගීත ස්වර ප්‍රස්තාරය - (අර්ධ චතුරශ්‍ර ජාති) | 79 |
| xiii. | ගීත ස්වර ප්‍රස්තාරය - (සංකීර්ණ ජාති) | 79 |
| xiv. | ගීත ස්වර ප්‍රස්තාරය - (වෙනදා එනකොට) | 83 |
| xv. | ගීත ස්වර ප්‍රස්තාරය - (තණ්ඩලේ) | 84 |
| xvi. | විකල්ප යති සහිත පැදි ප්‍රස්තාරය | 85 |
| xvii. | ගීත ස්වර ප්‍රස්තාරය - (ස්තෝත්‍ර) | 96 |
| xviii. | ගීත ස්වර ප්‍රස්තාරය - (කොහොඹ යාදින්න) | 99 |
| xix. | ගීත ස්වර ප්‍රස්තාරය - (වැදි මන්තර) | 101 |
| xx. | ගීත ස්වර ප්‍රස්තාරය - (කළවිටි පිරිත) | 102 |
| xxi. | ගීත ස්වර ප්‍රස්තාරය - (පත්තිනි යාදින්න) | 103 |
| xxii. | ගීත ස්වර ප්‍රස්තාරය - (අක්ෂර සැහැල්ල) | 109 |
| xxiii. | ගීත ස්වර ප්‍රස්තාරය - (පැල් පිරිත) | 110 |
| xxiv. | ගීත ස්වර ප්‍රස්තාරය - (ජාතක කථා ගායනය) | 111 |
| xxv. | ගීත ස්වර ප්‍රස්තාරය - (මංගර දෙවි සැහැල්ල) | 112 |

| | | |
|---|---|---|
| xxvi. | ගීත ස්වර ප්‍රස්තාරය - (මහ යාදින්න) | 113 |
| xxvii. | ගීත ස්වර ප්‍රස්තාරය - (චූර්ණිකා ගායනය) | 114 |
| xxviii. | ගීත ස්වර ප්‍රස්තාරය - (පිරිත් ගායනය) | 114 |
| xxix. | ගීත ස්වර ප්‍රස්තාරය - (අස්න ගායනය) | 119 |
| xxx. | $A_5$ හැඳින්වීමේ ස්වරමාලා වගුව | 123 |
| xxxi. | ගීත ස්වර ප්‍රස්තාරය - (ගාහක වන්නම) | 130 |
| xxxii. | ගීත ස්වර ප්‍රස්තාරය - (ගජගා වන්නම) | 132 |
| xxxiii. | ගීත ස්වර ප්‍රස්තාරය - (තුරඟා වන්නම) | 133 |
| xxxiv. | ගීත ස්වර ප්‍රස්තාරය - (උරඟා වන්නම) | 135 |
| xxxv. | ගීත ස්වර ප්‍රස්තාරය - (මුසලඩි වන්නම) | 136 |
| xxxvi. | ගීත ස්වර ප්‍රස්තාරය - (උකුසා වන්නම) | 137 |
| xxxvii. | ගීත ස්වර ප්‍රස්තාරය - (වෛරෝඩි වන්නම) | 141 |
| xxxviii. | ගීත ස්වර ප්‍රස්තාරය - (හනුමා වන්නම) | 142 |
| xxxix. | ගීත ස්වර ප්‍රස්තාරය - (මයුරා වන්නම) | 145 |
| xxxx. | ගීත ස්වර ප්‍රස්තාරය - (සැවුලා වන්නම) | 146 |
| xxxxi. | ගීත ස්වර ප්‍රස්තාරය - (සිංහරාජ වන්නම) | 147 |
| xxxxii. | ගීත ස්වර ප්‍රස්තාරය - (නෛඅඩි වන්නම) | 149 |
| xxxxiii. | ගීත ස්වර ප්‍රස්තාරය - (කිරලා වන්නම) | 149 |
| xxxxiv. | ගීත ස්වර ප්‍රස්තාරය - (ඊරඩි වන්නම) | 150 |
| xxxxv. | ගීත ස්වර ප්‍රස්තාරය - (සුරපති වන්නම) | 151 |
| xxxxvi. | ගීත ස්වර ප්‍රස්තාරය - (ගණපති වන්නම) | 153 |
| xxxxvii. | ගීත ස්වර ප්‍රස්තාරය - (උදාර වන්නම) | 155 |
| xxxxviii. | ගීත ස්වර ප්‍රස්තාරය - (උදාර වන්නම - 2) | 157 |
| xxxxix. | ගීත ස්වර ප්‍රස්තාරය - (අසදෘස වන්නම) | 160 |
| L. | වන්නම්වල ස්වර විහිදෙන අයුරු දැක්වෙන වගුව | 161 |
| Li. | ගීත ස්වර ප්‍රස්තාරය - (අනිලා වන්නම) | 164 |
| Lii. | ගීත ස්වර ප්‍රස්තාරය - (ආනන්ද වන්නම) | 164 |
| Liii. | ගීත ස්වර ප්‍රස්තාරය - (කිඳුරු වන්නම) | 165 |
| Liv. | ගීත ස්වර ප්‍රස්තාරය - (නාග ගජගා වන්නම) | 165 |
| Lv. | ගීත ස්වර ප්‍රස්තාරය - (තිසරා වන්නම) | 166 |
| Lvi. | ගීත ස්වර ප්‍රස්තාරය - (සිංහනාඩි වන්නම) | 166 |
| Lvii. | ගීත ස්වර ප්‍රස්තාරය - (මණ්ඩුක වන්නම) | 167 |

Lviii. ගීත ස්වර ප්‍රස්තාරය - (ශුද්ධ තාලය) 170

Lix. ගීත ස්වර ප්‍රස්තාරය - (කොණ්ඩනාච්චි තාලය) 171

Lx. ගීත ස්වර ප්‍රස්තාරය - (තාලරාග තාලය) 172

Lxi. ගීත ස්වර ප්‍රස්තාරය - (හයවැනි සිංදු වන්නම) 174

Lxii. ගීත ස්වර ප්‍රස්තාරය - (හයවැනි සිංදු වන්නම - 2) 175

Lxiii. ගීත ස්වර ප්‍රස්තාරය - (භානු සේ ගිමන්) 181

Lxiv. ගීත ස්වර ප්‍රස්තාරය - (ප්‍රශස්ති - නාරායන තේ) 183

Lxv. ගීත ස්වර ප්‍රස්තාරය - (වරමාතී චරිතේ) 188

Lxvi. ගීත ස්වර ප්‍රස්තාරය - (විරිදු ගායන) 194

Lxvii. ගීත ස්වර ප්‍රස්තාරය - (ගුත්තිල සින්දුව) 201

Lxviii. ගීත ස්වර ප්‍රස්තාරය - (දළදා සින්දුව ) 202

Lxix. ගීත ස්වර ප්‍රස්තාරය - (නාරිලතා සින්දුව ) 204

Lxx. ගීත ස්වර ප්‍රස්තාරය - (නාරිලතා සින්දුව - 2) 205

Lxxi. ගීත ස්වර ප්‍රස්තාරය - (පැල් කවි - දෙමලාගලේ) 214

Lxxii. ගීත ස්වර ප්‍රස්තාරය - (පැල් කවි - පාරක තොටක) 215

Lxxiii. ගීත ස්වර ප්‍රස්තාරය - (පැල් කවි - නෑනෝ නොවෙයි) 216

Lxxiv. ගීත ස්වර ප්‍රස්තාරය - (පැල් කවි - කරදර හිතට) 217

Lxxv. ගීත ස්වර ප්‍රස්තාරය - (පැල් කවි - සකලමුව) 217

Lxxvi. ගීත ස්වර ප්‍රස්තාරය - (පැල් කවි - යහපත් මිතුර) 218

Lxxvii. ගීත ස්වර ප්‍රස්තාරය - (පැල් කවි - වෙලේ පැලේ ) 219

Lxxviii. ගීත ස්වර ප්‍රස්තාරය - (පැල් කවි - යස ලෙසටම) 220

Lxxix ගීත ස්වර ප්‍රස්තාරය - (කරත්ත කවි - තණ්ඩලේ ) 225

Lxxx ගීත ස්වර ප්‍රස්තාරය - (කරත්ත කවි - තණ්ඩලේ - 2) 226

Lxxxi ගීත ස්වර ප්‍රස්තාරය - (කරත්ත කවි - වල්ලිය ගොණා) 227

Lxxxii ගීත ස්වර ප්‍රස්තාරය - (කරත්ත කවි - රත්වින්දට) 228

Lxxxiii ගීත ස්වර ප්‍රස්තාරය- (කරත්ත කවි - සසොඳ) 229

Lxxxiv ගීත ස්වර ප්‍රස්තාරය - (කරත්ත කවි - කතරගමට) 230

Lxxxv ගීත ස්වර ප්‍රස්තාරය - (පතල් කවි - මිනිරන් කන්ද) 235

Lxxxvi ගීත ස්වර ප්‍රස්තාරය - (පතල් කවි - කලුවන්) 238

Lxxxvii පතල් කවි ගායනයේ පරිස්‍රාවරණ රූප සටහන 239

Lxxxviii පතල් කවි ගායනයේ පරිස්‍රාවරණ රූප සටහන 240

Lxxxix ගීත ස්වර ප්‍රස්තාරය - (පතල් කවි - පුර සොඳිනා) 241

| | | |
|---|---|---|
| Lxxxx | ගීත ස්වර ප්‍රස්තාරය - (පාරු කවි - දමා තැල්ල) | 246 |
| Lxxxxi | ගීත ස්වර ප්‍රස්තාරය - (පාරු කවි - උපන්නේ) | 248 |
| Lxxxxii | ගීත ස්වර ප්‍රස්තාරය - (බමර කවි - වරාගම) | 252 |
| Lxxxxiii | ගීත ස්වර ප්‍රස්තාරය - (පාරු කවි - ඕඩි හෙලෙයි) | 253 |
| Lxxxxiv | සීපද ගායනයේ අවකාශ භාවිතය පිළිබඳ වගුව | 261 |
| Lxxxxv | සීපද ගායනයේ පරිස්‍රාවරණ රූප සටහන - 1 | 267 |
| Lxxxxvi | සීපද ගායනයේ පරිස්‍රාවරණ රූප සටහන - 2 | 267 |
| Lxxxxvii | සීපද ගායනයේ පරිස්‍රාවරණ රූප සටහන - 3 | 268 |
| Lxxxxviii | සීපද ගායනයේ පරිස්‍රාවරණ රූප සටහන - 4 | 269 |
| Lxxxxiv | සීපද ගායනයේ පරිස්‍රාවරණ රූප සටහන - 3 | 277 |
| C. | ගීත ස්වර ප්‍රස්තාරය (සිවුපද ගායනය) | 278 |
| Ci. | සීපද හා සිවුපද ගායනයේ පරිස්‍රාරණ රූප සටහන | 279 |
| Cii. | ගීත ස්වර ප්‍රස්තාරය -(සිවුපද ගායනය - ගෙඩි රස) | 280 |
| Ciii. | ගීත ස්වර ප්‍රස්තාරය -(නෙළුම් කවි ගායන - නමස්කාර) | 291 |
| Civ. | ගීත ස්වර ප්‍රස්තාරය -(නෙළුම් කවි ගායන - තේමිය) | 292 |
| Cv. | දිග් ඕස ගායනයේ පරිස්‍රාවරණ රූප සටහන | 293 |
| Cvi. | ගීත ස්වර ප්‍රස්තාරය -(නෙළුම් කවි ගායන - නානවිලේ) | 294 |
| Cvii. | ඕස ගායනවල වෙනස දැක්වෙන වගුව | 295 |
| Cviii. | ගීත ස්වර ප්‍රස්තාරය -(තලමල කවි ගායන - කොළඹ සිටන්) | 302 |
| Cix. | ගීත ස්වර ප්‍රස්තාරය -(තෙතගු කවි ගායන ) | 303 |
| Cx. | ගීත ස්වර ප්‍රස්තාරය -(කුරක්කන් කවි ගායන ) | 306 |
| Cxi. | ගීත ස්වර ප්‍රස්තාරය -(නැළවිලි කවි ගායන ) | 313 |
| Cxii. | ගීත ස්වර ප්‍රස්තාරය -(වැදි කවි ගායන ) | 314 |
| Cxiii. | ගීත ස්වර ප්‍රස්තාරය - (නැළවිලි කවි ගායන ) | 317 |
| Cxiv. | නැළවිලි කවි ගායනයේ විමර්ශන ප්‍රතිශත වගුව | 325 |
| Cxv. | ගීත ස්වර ප්‍රස්තාරය -(වැලපුම් කවි ගායන ) | 330 |
| Cxvi. | වැලපුම් ගායනයේ ස්වරාන්තර පරිස්‍රාවරණ රූප සටහන | 331 |
| Cxvii. | ගීත ස්වර ප්‍රස්තාරය -(වැලපුම් කවි ගායන ) | 332 |
| Cxviii. | ගීත ස්වර ප්‍රස්තාරය -(අස්න ගායන ) | 338 |
| Cxix. | ගීත ස්වර ප්‍රස්තාරය -(අස්න ගායන - 2 ) | 339 |
| Cxx. | අඬහැර ගායනයේ ස්වරාන්තර පරිස්‍රාවරණ රූප සටහන | 350 |
| Cxxi. | අඬහැර ගායනයේ ස්වරාන්තර පරිස්‍රාවරණ රූප සටහන -2 | 350 |

| | | |
|---|---|---|
| Cxxii. | අඬහැර ගායනයේ ස්වරාන්තර පරිස්‍රාවරණ රූප සටහන -3 | 351 |
| Cxxiii. | අඬහැර ගායනයේ යති පිළිබඳ වගුව | 352 |
| Cxxiv. | අඬහැර ගායනයේ පදනම් ස්වර පිළිබඳ වගුව | 354 |
| Cxxv. | අඬහැර ගායනයේ ස්වර වර්ණ හා අන්තරය පිළිබඳ වගුව | 356 |
| Cxxvi. | ගීත ස්වර ප්‍රස්තාරය -(ඔළිඳ කවි) | 374 |
| Cxxvii. | ගීත ස්වර ප්‍රස්තාරය -(බැති ගී) | 394 |
| Cxxviii. | ගීත ස්වර ප්‍රස්තාරය -(කිතුණු බැති ගී) | 397 |
| Cxxix. | ගීත ස්වර ප්‍රස්තාරය -(කවිතාල - රූ රුසේ - 1) | 400 |
| Cxxx. | ගීත ස්වර ප්‍රස්තාරය -(කවිතාල - අපසිය ඇස - 2) | 401 |
| Cxxxi. | ගීත ස්වර ප්‍රස්තාරය -(කවිතාල - කසේ සැමිටි - 3) | 403 |
| Cxxxii. | ගීත ස්වර ප්‍රස්තාරය -(කෝලම් කවි - 1) | 410 |
| Cxxxiii. | ගීත ස්වර ප්‍රස්තාරය -(කෝලම් කවි - 2) | 412 |
| Cxxiv. | ගීත ස්වර ප්‍රස්තාරය -(කමත් කවි) | 420 |
| Cxxxv. | ගීත ස්වර ප්‍රස්තාරය -(කළගෙඩි කවි) | 423 |
| Cxxxvi. | ගීත ස්වර ප්‍රස්තාරය -(සවුදම - ගණපති) | 428 |
| Cxxxvii. | නාද ස්ථාන 1200 ඇතුළත් ශත මිනුම් ප්‍රස්තාරය | 442 |
| Cxxxviii. | සංඛ්‍යාත වගුව - (මලේ මලේ කවිය) | 443 |
| Cxxxix. | ශත සංඛ්‍යා දක්වෙන් නාද ස්ථාන වගුව | 445 |
| Cxxxx. | සිංහල ජනකවිවල නාද අන්තරය සහිත ශත මිනුම් වගුව | 447 |
| Cxxxxi. | අඬහැර ගායනයේ සංඛ්‍යාත අගයන් සහිත වගුව | 449 |
| Cxxxxii. | ස්වර සංඛ්‍යාත වගුව (MIDI Reference Chart) | 450 |

## උපකාරානුස්මෘතිය

මෙම දර්ශනසූරි උපාධි නිබන්ධය ලිවීමේ දී මා හට බොහෝ පිරිසක ගේ උපකාරය නොමඳ ව ලැබුණු බව ඉතා සතුටින් සිහිපත් කරනු කැමැත්තෙමි. මෙම කාර්ය සාර්ථක කරගැනීමට නිබඳව ම සහය දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති ඇතුලු කාර්යය මණ්ඩලයට ද මාගේ ස්තුතිය පළ කරමි. මාගේ දර්ශනසූරී උපාධියේ උපදේශකවරුන් වශයෙන් කටයුතු කළ ආචාර්ය ඩබ්ලිව් බී. ඒ. විතාරණ, මහාචාර්ය රංජිත් ප්‍රනාන්දු යන ගුරු පියවරුන්ට සහ පර්යේෂණයේ නිති ප්‍රමිතිය කියාදෙමින් මා දිරිමත් කළ මහාචාර්ය වෝල්ටර් මාරසිංහ ගුරු පියාණන්ටත් මගේ ප්‍රණාමය පිරිනමමි. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ කුලපති මහාචාර්ය සනත් නන්දසිරි ගුරු පියාණන්, උපකුලපතිතුමා, සංගීත පීඨාධිපතිතුමා, මහාචාර්ය කෝලිත භානු දිසානායක ගුරු පියාණන් ඇතුළු සංගීත පීඨයේ ආචාර්යවරුන්ටත් මාගේ ස්තුතිය පළ කරමි. විෂයානුබද්ධ ව ඇතිවූ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා මෙන් ම විෂය දැනුම ලබා දීම සඳහා වෙහෙසුනු මහාචාර්ය ලයනල් බෙන්තරගේ ගුරුතුමාත්, රෝහණ බැද්දගේ ගුරුතුමාත් ජන කවියේ භාවිතය ප්‍රායෝගික ව සංගත තැටි ඇසුරින් පෙන්වා දුන් ප්‍රවීන සංගීත ශිල්පී රංජිත් බාලසූරිය මහතාත් අයිවෝ ඩෙනිස් සහ වීරසේන ගුණතිලක යන ජන සංගීත ශිල්පීන්ටත් මාගේ ප්‍රණාමය පළ කරමි. පටිගත කරන ලද ජන ගායන ශ්‍රවණය කිරීම සඳහා අවස්ථාව ලබා දුන් ශ්‍රී ලංකා ගුවන් විදුලිය සංස්ථාවේ සභාපති ඒරානන්ද හෙට්ටිආරච්චි මහතා ඇතුළු පුස්තකාල කාර්ය මණ්ඩලයටත් සෞන්දර්ය කළා විශ්වවිද්‍යාලයේ සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිවරු ඇතුළු අනධ්‍යයන සේවක මණ්ඩලයටත්, කොළඹ මහජන පුස්තකාලය, කෞතුකාගාර පුස්තකාලය, හොරණ සහ පොකුණුවිට පුස්තකාලවල සේවක මහත්ම මහත්මීන්ට ද ස්තුතිය පළ කරමි.

අවශ්‍ය පොතපත සොයා දෙමින් මා සමග සියලු දුක් දරාගෙන ලංකාවේ විවිධ ප්‍රදේශවල පර්යේෂණ කටයුතුවලට සහභාගී වූ පුබුදු බස්නායක, සමන් ලෙනින්, ඩිලාන් වික්‍රමසිංහ, යොහාන් රණසිංහ, සංඛ ජයලත්, ඉන්දික රත්නායක, විරාජ් ජයවර්ධන ඇතුලු මාත්‍රා ජන සංගීත කණ්ඩායමේ සියලුම ශිල්පීන්ට හා ශිල්පිනියන්ට ද මාගේ ස්තුතිය පළකරමි.

මෙම පර්යේෂණයට අවශ්‍ය ජන කවි ගායන ඉදිරිපත් කළ විවිධ ප්‍රදේශවල ජීවත්වන ගැමි ජනතාවටත්, පර්යේෂණයට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ලබා දුන් අම්පාර රෝහලේ වෛද්‍ය අධිකාරි ලංකාතිලක ජයසිංහ මහතාටත්, මින්නේරිය, ගාල්ල, නුවර, බලංගොඩ දඹුල්ල, ත්‍රිකුණාමලය, ඇඹිලිපිටිය, මාතලේ, කුරුණෑගල, මාතර, උඩුදුම්බර, මීගමුව, හොරණ, පානදුර, මිණිපෙ, හාරිස්පත්තුව, ගම්පොළ, නුවරඑළිය වැනි ප්‍රදේශවල දී සිදුකළ පර්යේෂණ කටයුතු සඳහා සහයෝගය හා නවාතැන් පහසුකම් සලසා දුන් සංස්කෘතික නිලධාරීන්ට, හිතවතුන්ට සහ ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම්වරුන්ට ද මාගේ ප්‍රණාමය පුද කරමි.

පර්යේෂණයේ නිසි ප්‍රමිතිය කියා දෙමින් හමු වූ හැම අවස්ථාවක ම ඒ පිළිබඳ සොයා බැලූ ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර, මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ, යන විද්වතුන්ට හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කුසුමලතා ලංකාමුල්ල මහත්මියට ද මගේ ප්‍රණාමය පුද කරමි. පටිගත කරන ලද ජනකවිවල හඬ විවිධ තාක්‍ෂණික මෙවලම්, පරිගණක මෘදුකාංග මගින් හා පරිස්‍රාවණ රූප සටහන් මගින් නිවැරදිව විමර්ශනය කිරීමට අවශ්‍යවන දැනුම නිහතමානීව මා වෙත ලබා දුන් කථිකචාර්ය චාරුදත්ත ඉලංගසිංහ මිතුරාව ද ආදරයෙන් සිහිපත් කරමි. පටිගත කරන ලද ජන කවි සංස්කරණය කරමින් සකස් කර දුන් අකංලංක පනාපිටිය ලොකු පුතාට ද සෝදුපත් බලමින් අකුරු නිවැරදි කිරීමට අවශ්‍ය මග පෙන්වා දුන් පුබුදු බස්නායක හිතවතාව ද ආදරයෙන් සිහිපත් කරමි.

මා මෙලොවට බිහිකරමින් ලෝකය දකින්නට, කියවන්නට නැණ ලබා දුන් කරුණානායක පොඩිමැණිකේ ආදරණීය අම්මාට සහ විමර්ශනයෙන් හා අධ්‍යයනයෙන් සංගීත විෂය තනිව උගත යුතු බව ප්‍රායෝගික ව පසක් කරදුන් ගුණසේන පනාපිටිය තාත්තාව ද අප්‍රමාණ ගෞරවයෙන් සිහිකරමි. මෙම සද්කාර්යය සපල කර ගැනීමට අවැසි විවේක බුද්ධිය ලබා ගැනීමට සියලු වගකීම්වලින් මා නිදොස් කොට නිදහස් කළ ආදරණීය බිරිඳ සුභද්‍රා පනාපිටියටත්, අකලංක, තනුසර, සඳලි පනාපිටිය ආදරණීය දරුරුවන් තිදෙනාටත් මාගේ ප්‍රණාමය පුද කරමි.

# ශ්‍රී ලාංකේය ජන ගායනයන්හි ප්‍රකට වන  සිංහල ගායන ශෛලී

## පනාපිටි කංකානමලාගේ සමන් ප්‍රේමසිරි රත්න කුමාර


සාර සංක්ෂේපය

ප්‍රාග් බෞද්ධ යුගයේ සිට මෙරට වාසය කළ ජනයා අතර පැවති විවිධ ඇදහිලි හා විශ්වාස සිරිත් විරිත් යනාදිය පවත්වාගෙන යාම සඳහා විවිධ ජනශ්‍රැතීන් හා ජන කවි භාවිත කරන්නට ඇත. එහෙත් ඒවා නිශ්චිත ව ම සොයා ගැනීම අසීරු ය. යන්ත්‍ර මන්ත්‍ර ආදී අභිචාර විධි කෙරෙහි ද දැඩි විශ්වාසයක් පෙර සිට ම මෙරට ජනයා තුළ පැවති බව වර්තමානය දක්වා දිවෙන යාතුකර්ම සාහිත්‍යයෙන් පසක් කරගත හැකි ය. විවිධ කාලවල දී පවත්වන්නට යෙදුණු එවැනි උත්සවවලින් හෙළි වන්නේ ද සිංහල ජනතාව සතු ගායන, වාදන, නර්තන හැකියාව ම ය.

කවිය සිංහල ජාතිය ආරම්භ වීමටත් පෙර සිට ම මේ රටේ පවතින්නට ඇති බව විද්වතුන්ගේ මතය යි. විවිධ හේතූන් නිසා ඒ කවි අපට අහිමි වී තිබේ. ඈත අතීතයේ සිට ජන කවි භාවිත වු බවට සාධක සොයාගත හැකි ය. එහෙත් ජන කවියේ ආරම්භය කවදා කොතැනක දී සිදු වු දෙයක් දැ යි නිශ්චිත ව කිව නොහැකි ය. එහෙත් සිංහල වංශකථාවල සඳහන් යම් යම් ජනප්‍රවාද හා ජනශ්‍රැතීන් මගින් ජන කවියේ පෞරාණික බව පිළිබඳ හෝඩුවාවක් පමණක් සොයාගත හැකි ය. ජන කවිය නිරන්තරයෙන් ගායනය සඳහා ම නිපන් කවි වන අතර ඒවා හඬ නගා ගැයීම සිංහලයා ගේ සිරිත ය. ඔවුන් විසින් යසෝදරාවත, වෙස්සන්තර ජාතකය මෙන් ම සන්දේශ කාව්‍යය ද ගමේ දී හඬ නගා ගායනය කරන ලදි. පුරාණයේ මුද්‍රණ යන්ත්‍ර නොතිබුණු හෙයින් පොතක පිටපත් තිබුණේ එකක් හෝ දෙකක් පමණි. එක් අයෙකු පොතක් කියවන අතර විශාල පිරිසක් එය අසා රස වින්දහ. එහි දී කවි ගායනය කිරීම නිරන්තරයෙන් සිදු විය. විදේශිකයින් සිංහලයන් කවියන් ලෙස දකින්නට ඇත්තේ ද ඒ නිසා විය යුතු ය.

ජන කාව්‍ය, ජන කවි, ගැමි ගී, පාරම්පරික ගී, සාම්ප්‍රදායික ගායන යන යෙදුම්වලින් ගම්‍ය වන්නේ එක ම අරුතකි. වර්තමානයේ ඒ සඳහා ජන කවි හා ජන ගී යන පොදු ව්‍යවහාරය යොදනු ලැබේ. ජන කවි ගායනය නිසා ම උපන් ගායන විධි රාශියකි. සීපද, ශාන්තිකර්ම, වන්නම් හා ප්‍රශස්ති, ගද්‍ය හා සැහැළි, නැළවිලි, නෙළුම්, වැලැපුම්, කෙළි ගී, අඬහැර යන ගායන විධි උදාහරණ සේ හඳුනාගත හැකි ය. ඒවා සිංහලයන්ට ම ආවේණික වූ

ගායනයෝ ය. එහි ප්‍රකට වන්නේ සිංහල ගායන ශෛලිවල ලක්ෂණ ය. ඒවා සිංහල ගායන ශෛලි ලෙස වර්ග කළ හැකි වන්නේ එබැවිනි. උක්ත ගායන ශෛලි පිළිබඳ ව විධිමත් ව හා පර්යේෂණාත්මක ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ දී සිදු කරන ලදී. සිංහල ජන කවි පිළිබඳ ව විධිමත් වර්ගීකරණයක් මෙතෙක් සිදු වී නැත. ජන කවි පිළිබඳ විධිමත් ගායන ශෛලිවලින් ප්‍රකට වන වර්ගීකරණයක් ඉදිරිපත් කිරීම පිළිබඳව ද මෙහි දී විමර්ශනයට ලක් කරන ලද්දේ එබැවිනි.

වර්තමාන ජන කවි ගායනය විධිමත් ය, විචිත්‍ර ය, ක්‍රමවත් ය. එබැවින් ඒවා ගායනය කිරීම ද විධිමත් ය. එයට ම ආවේණික වූ නාද රටා, නාද සංයෝජන මතු නො ව ගායන ක්‍රමවේද, කටහඬ භාවිත වන ශිල්පීය ක්‍රම හා කටහඬේ තාක්ෂණික භාවිතය ද තත් කවි ගායන ඉදිරිපත් කරනු ලබන අවස්ථා හා පාරිසරික පිහිටීම් අනුව නිර්මාණය වී ඇති බව පැහැදිලි කරගත යුතු ව ඇත. තත් ගායන ක්‍රම නිසා බිහි වූ ගායන ශෛලි පිළිබඳ සංගීතමය පරිකල්පනයෙන් සාකච්ඡා කිරීම මෙතෙක් සිදු වී නොමැති බැවින් අප විසින් එහි අවශ්‍යතාව හඳුනාගෙන මෙම පර්යේෂණයේ දී ජන ගායන ශෛලි පිළිබඳ විමර්ශනය සිදු කරන ලදී.

**ප්‍රමුඛ පද** ගායන ශෛලි. කටහඬ තාක්ෂණය, නාදශ්‍රේණි, නාද සංරචනය,

ශත මිනුම් ක්‍රමය,